කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක :40

මගේ අංකය ඩීඑම්එස්/ඒ/08/21
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහ භාණ්ඩාගාරය
කොළඹ 01

2009.11.26

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/පළාත්සභා ප්‍රධාන ලේකම්වරුන්/
සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් වෙත.

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන ඇති ප්‍රාථමික මට්ටමේ සේවකයින් ස්ථිර කිරීම**

2009.11.18 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය අනුව 2009.10.31 දිනට අඛණ්ඩව දින 180 ක් සේවය කර ඇති සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව වැටුප් ගෙවනු ලබන ප්‍රාථමික ශ්‍රේණියේ (PL වැටුප් කාණ්ඩය හිමි) තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන සේවකයින් ස්ථිර කිරීම භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අධ්‍යයනයකින් පසුව සිදු කෙරෙනු ඇත.

02. එබැවින්, අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවාගෙන ඇති පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන සේවකයින් පිළිබඳ තොරතුරු මේ සමග යාකර ඇති 'අ' ආකෘතිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2009.12.18 දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ / පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව ආයතනයේ පත්වීම් බලධාරියා විසින් පත්වීම් ලිපියක් නිකුත් කර තිබීම.

(ආ) අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුකූල සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) 2009.10.31 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි වියයුතුය. (එසේ වුවත් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත පත්වීම ලබන අවස්ථාවේදී වයස අවු.45 නොඉක්මවූ සේවකයින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඈ) 2009.10.31 දිනට අඛණ්ඩව අවම වශයෙන් දින 180 ක් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත අදාළ තනතුරෙහි සේවය කර තිබීම (මෙය ආයතනයේ වැටුප් ලේඛණවලින් සනාථ වියයුතුය.)

03. ඉහත සඳහන් (අ) හා (ආ) සහ (ඇ) අවශ්‍යතාවයන් සපුරා තිබීම පිළිබඳව අධ්‍යක්ෂ (පිරිස් පාලන) / පිරිස් කළමනාකරු විසින් පුද්ගලිකව පරීක්ෂාකරබලා, සෑහීමකට පත්ව සහතික කළයුතු අතර, (ඇ) අවශ්‍යතාවය ගණකාධිකාරී හෝ අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් පෞද්ගලිකව පරීක්ෂාකරබලා, සෑහීමකට පත්වී සහතික කළ යුතුය.

04. ආකෘති පත්‍ර නිවැරදිව සම්පූර්ණ කර නියමිත ස්ථානවල සාමාන්‍යාධිකාරී හෝ පිරිස් කළමනාකරු සහ ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් අත්සන් සහ නිල මුද්‍රාව තබා ආයතනයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරීන්ගේ ආවරණ ලිපියක් සමග අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු වේ.

05. සේවා සපයන බාහිර ආයතනවලින් ගිවිසුම් මත සේවයේ යොදවා ගෙන ඇති සේවකයින් (Outsource Basis) කිසිසේත්ම මෙම කාර්ය සඳහා ඇතුළත් නොකිරීමට විශේෂයෙන් වගබලාගත යුතු බව අවධාරණය කරමි.

06. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් සඳහා බඳවාගත් කාර්යමණ්ඩලවලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

07. සියලුම රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල කාර්යමණ්ඩල පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම අවශ්‍යව ඇති බැවින්, මීට අමුණා ඇති 'ආ' ආකෘතිය උපයෝගිකර ගනිමින් ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ද මේ සමගම කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු මැනවි.

08. මේ පිළිබඳව කිසියම් පැහැදිලි කිරීමක් වෙතොත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ.කේ.එන්.වික්‍රමසිංහ මහතා, (දුරකථන අංක 011-2484758) හෝ සහකාර අධ්‍යක්ෂ දිපාල් සිරිබද්දන මහතා (දුරකථන අංක 011-2484903) හෝ අමතනු මැනවි.

09. ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් ඉහත පරිදි ස්ථිර තනතුරුවලට පත්කිරීමේදී දැරීමට සිදුවන අතිරේක වැයබර ආයතනය සතුව ඇති මූල්‍ය ප්‍රතිපාදන තුළ කළමනාකරණය කරගත යුතු බව ද කරුණාවෙන් සලකන්න.

එස්.අබේසිංහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වැඩබලන ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්.
2. අග්‍රාමාත්‍ය ලේකම්.
3. විගණකාධිපති.
4. ලේකම්, මුදල් කොමිෂන් සභාව.
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව.
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව.

'ආ'ආකෘතිය

# කාර්ය මණ්ඩල වාර්තාව

අමාත්‍යාංශය :-

සංස්ථාව/ව්‍යවස්ථාපිත ආයතනය :-

| තනතුරු නාමය | ශ්‍රේණිය | සේවා තත්ත්වය (විධායක/ප්‍රාථමික/ද්විතීය/ තෘතීය) | වැටුප් කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව 2009.10.31 දිනට | අතිරික්ත සේවක සංඛ්‍යාව | අත්‍යාවශ්‍යයෙන් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

මේ සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වුවහොත් සම්බන්ධවිය හැකි නිලධාරියාගේ,

නම හා තනතුර :-

දුරකථන අංකය :-

'අ' ආකෘතිය

2009.11.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්ථිර කිරීම සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවක තොරතුරු සැපයීම
(2009.10.31 දින වනවිට අඛණ්ඩව දින 180 ක් සේවය කර ඇති ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබූ සේවකයින් පමණි.)

සංස්ථාවේ/මණ්ඩලයේ නම :-

ආයතනය ඇති කරන ලද පනත හෝ අමාත්‍ය මණ්ඩල තීරණය හා දිනය :-
(පිටපතක් අමුණන්න)

අයත්වන රේඛීය අමාත්‍යාංශය, පලාත් සභාවේ අමාත්‍යාංශය

| අනු අංකය | සේවකයාගේ නම (මුලකුරු සමග) | ජාතික හැඳුනුම්පත් අංකය | උපන් දිනය | දරනු ලබන තනතුර | (අනියම්/ආදේශක) පත්වීම ලබාදුන් දිනය | පත්වීම ලබාදුන් දිනට වයස අවු. මාස. දින. | පත්වීමේ ස්වභාවය (අනියම්/ආදේශක ආදී වශයෙන්) | 2009 ඔක්තෝබර් මස ගෙවනු ලැබූ වැටුප (රුපියල්) | ස්ථිර කළ පසු මාසික ආරම්භක වැටුප (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | එකතුව | | |

ඉහත තොරතුරු නිවැරදි අතර, මෙම සේවකයින් 2009.10.31 දිනට දින 180ක් අඛණ්ඩව සේවයේ යෙදී සිටි බවත්, බඳවා ගැනීම් පරිපාටි අනුව අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇති බවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සඳහා තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/සහන පදනම මත බඳවාගෙන ඒ අනුව පත්වීම් ලිපි නිකුත් කර ඇති බවත් සහතික කරමි.

සාමාන්‍යාධිකාරී/පිරිස් කළමනාකරු
තිල මුද්‍රාව
දිනය :-

අධ්‍යක්ෂ(මුල්‍ය)/ගණකාධිකාරී
තිල මුද්‍රාව
දිනය :-

ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි අතර, මෙම සේවකයින් ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව තුලට ගැනෙන අතර, ඔවුන් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

සභාපති
තිල මුද්‍රාව
දිනය